**13-04-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ ඒ සීමිතත්ත්වයක් නොමැති වූ ලෝකයේ පාලකයන් බවට පත්වනවා. ඔබ යෝගා බලයෙන් මේ මුළු ලෝක රාජ්‍යයම ලබා ගන්නේ කෙසේද යන්නත් පුදුමයක්.

**ප්‍රශ්නය:** පියා පවා බැඳී සිටින මේ නාටකයේ එකම බැම්ම කුමක්ද?

**පිළිතුර:** බාබා කියනවා : මම දරුවන් ඉදිරියට පෞද්ගලිකවම පැමිණිය යුතුයි. මමත් මෙම බැම්මෙහි බැඳී සිටිනවා. මා පැමිණෙන තුරු මේ පටලැවුණු රැහැන ගලවා දැමිය නොහැකියි. මා එන්නේ ඔබට ආශීර්වාද දීමට හෝ අනුකම්පා කිරීමට හෝ නොවේ. මා මිය ගිය අයට නැවත පණ දෙන්නේත් නැහැ. මා එන්නේ ඔබව පාරිශුද්ධත්වයට පත් කිරීම සඳහායි.

**ගීතය:** ඔබ සොයා ගැනීමෙන් මා සියලු දේ සොයා ගත්තා.

ඕම් ශාන්ති. ඔබ පියා ඉදිරියේ අසුන්ගෙන සිටින නිසා මෙම ගීතය ඇසෙන විට ඔබගේ ඇඟේ හිරි ගඩු පිපිය යුතුයි. ලෝකයේ කෙතරම් මහාචර්යවරුන්, පණ්ඩිතයන් හා ගුරුන් සිටියා වුවත් ඒ කිසිම කෙනෙක් අසීමිත වූ පියා අවුරුදු 5000ට වරක් මෙහි පැමිණෙන බව දන්නේ නැහැ. මෙය දන්නේ දරුවන් පමණයි. දරුවන් කියනවා මම කවුරු වුවත් මා කෙසේ වුවත් මා ඔබගේයි. පියාත් කියනවා ඔබ කවුරු වුවත් ඔබ කොහොම වුවත් ඔබ මගේ දරුවායි. ඔබ දන්නවා සියලුම ජීවයන්ගේ පියා වන්නේ ඔහු බව. සැම කෙනෙක්ම ඔහුට කතා කරනවා. පියා විස්තර කරනවා රාවන්ගේ විශාල සෙවනැල්ලක් තිබෙනවා. ඔවුන් උත්තරීතර පියා උත්තරීතර ජීවය ලෙස කතාකරන තැනැත්තාගෙන් තමන් සතුටක් අත් දකින්නේ ඇයි යන්න කිසිම කෙනෙක්ට තේරුම් ගත නොහැකියි. ඔවුන්ට එය අමතක වෙලා. එම උරුමය අපට දෙන්නේ මේ බාබා පමණයි. පියාම විස්තර කර කියනවා එවන් වූ පහසු කරුණක් කිසිම කෙනෙක් තේරුම් ගන්නේ නැහැ! මුළු ලෝකයාම හඬ නඟා කතා කරනා ඒ තැනැත්තා තමා බව පරම පියා විස්තර කරනවා. ඔවුන් 'අහෝ කුදා! අහෝ රාමා!' කියා අඬගසමින් තම ශරීරයන් අත් හරිනවා. එම පියාම ඔබට උගන්වනවා. දැන් ඔබගේ බුද්ධිය ඒ වෙතට ගිහින්. මීට පෙර කල්පයේදී පැමිණියාක් මෙන්ම බාබා දැනුත් මෙහි පැමිණ සිටිනවා. බාබා සැම චක්‍රයකදීම මෙහි පැමිණ ඔබව පාරිශුද්ධත්වයට පත්කොට ඔබව පරිහානියෙන් විමුක්තිය කරා රැගෙන යනවා. මෙවැනි ගීතයක් තිබෙනවා සැම කෙනෙකුගේම පාරිශුද්ධකරු වූ පියා. දරුවන් දැන් ඔහු ඉදිරියෙහි හිඳගෙන සිටිනවා. ඔබ තමයි වඩාත්ම මිහිරි වූ ආදරණීයම දරුවන්. මෙය අදාල වන්නේ භාරතයේ මිනිසුන්ටයි. පියා උපත ලබන්නේ භාරතයේයි. පියා කියනවා මා උපත ලබා ගන්නේ භාරතයේදී නිසා ඔවුන් අනිවාර්යෙන්ම ආදරයට ලක්වනවා. සැම කෙනෙක්ම ඔහුව සිහි කරනවා. කෙනෙක් අයත්වන්නේ කුමන ධර්මයටද ඔහු ආගමෙහි නිර්මාතෘවරයාව සිහි කරනවා. භාරතයෙහි මිනිසුන් ඔවුන් ආදී සනාතන දේවී දේවතා ධර්මයට අයත් වූවා කියා දන්නේ නැහැ. භාරතය පැරණිතම දේශය බව බාබා විස්තර කරනවා. ඉතින් ඔවුන් අහනවා භාරතය මීට පෙර ස්ථාපිත වූවා කියා කියන්නේ කවුද? ඔවුන් බොහෝ දේවල් අසා තිබෙනවා. කෙනෙක් එක් දෙයක් කියනවා. තවත් කෙනෙක් තවත් දෙයක් කියනවා. සමහරු අහනවා කවුද කියන්නේ ශිවා වන උත්තරීතර ජීවය ගීතාව කිව්වා කියලා? ක්‍රිෂ්ණා නම් වූයේ උත්තරීතර ජීවයමයි ඉතින් ඔහු තමයි ගීතාවත් ගැයුවේ. ඔවුන් කියනවා දෙවියන් සැම තැනම ඉන්නවා. ඒ වගේම මුළු ක්‍රීඩාවම ඔහුගේමයි. මේ සැම දෙයක්ම දෙවියන්ගේ ස්වරූපයන්. දෙවියන් ඔහුගේ දිව්‍යමය ක්‍රියාවන් කිරීම උදෙසා නොයෙකුත් ආකාරයේ ස්වරූපයන් යොදා ගන්නවා. දෙවියන්ට ඔහුට අවශ්‍ය ඕනෑම දෙයක් කළ හැකියි. මායා කෙතරම් බලවත්ද යන්න දැන් ඔබට තේරුම් ගත හැකියි! අද ඔවුන් කියනවා බාබා මම අනිවාර්යෙන්ම උරුමය ලබාගෙන සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් දේවතා තත්ත්වයට පත්වෙමි. නමුත් ඔවුන් හෙට වන විට මෙහි නැහැ. ඔබ දන්නවා කී දෙනෙක් බාබාව අතහැර ගියාද කියලා. ඔවුන් තම මෝටර් රථයේ මමාව නංවාගෙන ඇවිදින්න ගියා. අද වන විට ඔවුන් තව දුරටත් මෙහි නැහැ. එවන් වූ හොඳ දරුවන් පවා මායාගේ ආශ්‍රයට පතුලටම වැටුණා. මීට පෙර කල්පයේ තේරුම් ගත් අය නැවතත් තේරුම් ගන්නවා. අද වන විට මෙම ලෝකය පත් වී තිබෙන තත්ත්තවය දෙස බලන්න! ඔබ දරුවන් පත්වෙන තත්ත්වය දෙස බලන්න! ඔබ ගීතයට සවන් දුන්නා. එහි කිව්වා අපි කෙතරම් ලොකු උරුමයක් ලබා ගන්නවාද කියතොත් අප මුළු ලෝකයේම පාලකයන් බවට පත්වෙනවා. එහි කිසිම සීමිත බවක් නැහැ. නමුත් මෙහි සැම තැනම තිබෙන්නේ සීමිත බවක්. මිනිස්සු කියනවා ඔබේ ගුවන් යානා අපේ ගුවන් තොටුපොළට ඇතුළු වුවහොත් අපි ඒවාට වෙඩි තියනවා. එහි කිසිම දෙයක් සීමිත නැහැ. මෙම

ගීතය ගයනවා, නමුත් කිසිම කෙනෙක් එහි අර්ථය දන්නේ නැහැ. බාබා මාර්ගයෙන් ඔබ නියත වශයෙන්ම නැවතත් ලෝක පාලකයන් බවට පත්වන බව ඔබට වැටහෙනවා. බොහෝ වතාවන්හිදි ඔබ මෙම උපත් 84හි චක්‍රය පුරා ගොස් තිබෙනවා. ඔබ ඉතා කෙටි කාලයක් තුළ දුක් වින්දා. නමුත් ඔබ විශාල සතුටක් අත්වින්දා. මේ නිසා තමයි බාබා කියන්නේ මා දරුවන්ට අසීමිත සතුටක් දෙනවා. දැන් මායාට රැවටෙන්න එපා! පියාට දරුවන් බොහෝ දෙනෙක් ඉන්නවා. සෑම කෙනෙකුටම එකම තත්ත්වයකට බලවත් විය නොහැකියි. කෙනෙක්ට දරුවන් 5ක් හෝ 7ක් සිටියදී එයින් එක්කෙනෙක් හෝ දෙදෙනෙක් දුබල වුවහොත් ඔවුන් ඔහුගේ ඔළුව නරක් කරනවා. ඔවුන් සිය දහස් මිලියන ගණන් මුදල් නිකරුනේ අපතේ හරිනවා. පියා සම්පූර්ණයෙන්ම නිවැරදි වූ ජීවයක් විය හැකි වන නමුත් ඔහුගේ දරුවාගේ ගිණුමෙහි කිසිම මුදලක් ඉතිරිව නොතිබිය හැකියි. බාබා එවන් වූ උදාහරණ කීපයක් දැක තිබෙනවා. දරුවන් දන්නවා ලෝකයේ සිටින සියලුම මිනිසුන් ඒ ආධ්‍යාත්මික පියාගේ දරුවන් වන බව. පියා කියනවා මේ භාරතය මා උපන් බිමයි. සෑම කෙනෙක්ම තම දේශය අගය කරනවා. ඔවුන් වෙනත් රටක මිය ගිය හොත් ඔවුන්ගේම දේශයට නැවතත් ගෙන එනවා. පියා එන්නේත් භාරතයටයි. ඔහු භාරතයේ මිනිසුන් වන ඔබට නැවතත් වතාවක් ඔබගේ අසීමිත උරුමය ලබා දෙනවා. ඔය දරුවන් කියනවා ඔබ නැවතත් දේවතාවන්, ලෝක පාලකයන් බවට පත්වනවා කියා. ඔබ තමයි ඒ පාලකයන් සේ සිටියේ. ඔබ සිටි තත්ත්වයේ සිට දැන් පත්ව ඇති තත්ත්වය දෙස මදක් විමසා බලන්න. නැවත නැවතත් උපත් 84ක් ලබා ගැනීම හේතුවෙන් ඔබගේ තත්ත්වය මෙවැනි තත්ත්වයකට පත්ව තිබෙනවා. නාටකය වටහාගත යුතුමයි. මෙය හඳුන්වන්නේ ජයග්‍රහණයේ හා පරාජයේ ක්‍රීඩාව ලෙසයි. මෙය භාරතය පිළිබඳ වූ ක්‍රීඩාවක්. ඒ වගේම ඔබටත් එහි කොටසක් තිබෙනවා. නාටකයේ උසස්ම වූ කොටස තිබෙන්නේ ඔබටයි. ඔබ මුලු ලෝකයේම පාලකයන් බවට පත්වනවා. ඔබ විශාල සතුටක් අත් දකිනවා. ඔබ මෙන් සතුටක් අත් විඳීමට වෙන කිසිම කෙනෙකුට බැහැ. මෙහි මුල්ම නම සත් යුගය යන්නයි (දිව්‍ය ලෝකය) . මෙය අපායයි. මෙහිදී ඔබ ලබන සතුට හරියට කපුටෙකුගේ පැහැරීමක් වැනියි. අද ඔවුන් ලක්ෂපතියන්. නමුත් ඊලඟ උපතේදී ඔවුන් කුමන තත්ත්වයකට පත්වේදැයි ඔබ දන්නේ නැහැ. මෙය පාපකාරී ජීවයන්ගේ ලෝකයයි. සත් යුගය පුණ්‍යවන්ත ජීවයන්ගේ ලෝකයයි. ඔබ පුණ්‍යවන්ත ජීවයන් බවට පත්වන නිසා කිසිම විටෙක කිසිම පාපයක් නොකළ යුතුයි. සෑම විටම බාබා සමඟ සෘජුවන්න. මන්ද, ආණ්ඩුව අතේ තමයි ධර්මරාජ ඉන්නේත්. පරමාත්ම පියා කියනවා තඹ යුගයේ සිට ධර්මරාජ සෑම විටම මා සමඟ සිටිනවා. සත් යුගයේදී ධර්මරාජ මා සමඟ ඉන්නේ නැහැ. ඔබ මගේ නාමයෙන් තඹ යුගයේ සිටම වන්දනාමාන කළා. ඔවුන් දෙවියන්ගේ නාමයෙන් පූජා කිරීම ගැන කතා කරනවා. ක්‍රිෂ්ණා ගේ නමද ඇතුලත් කිරීමෙන් ඔවුන් ක්‍රිෂ්ණාටත් පූජා පවත්වනවා කියා ලියා තිබෙනවා. එහි ඵලය ලබා දෙන්නේ ඒ එකම එක පියා පමණයි. මේ නිසා ක්‍රිෂ්ණාට පූජා පවත්වනවා කියා කීම වැරදියි. දෙවියන්ට පූජා පවත්වනවා කියා කීම නිවැරදියි. තමන් ශ්‍රී ගනේෂ්ට පූජා කරනවා කියා කීමෙන් කිසිම දෙයක් ලබාගත නොහැකියි. කෙසේවෙතත්, මා සෑම කෙනෙකුටම ඔවුන්ගේ භක්තියෙහි ඵලය ලබා දී තිබෙනවා. කිසිම කෙනෙක් මාව දන්නේ නැහැ. දැන් දරුවන් වන ඔබ පමණයි දන්නේ ඔබ සියලු දේ බාබා වෙනුවෙන් පූජා කරනවා කියා. බාබාත් කියනවා මා ඔබට ඔබගේ උපත් 21ක උරුමය ලබාදීම උදෙසා පැමිණ සිටිනවා. දැන් ඔබ ලබා සිටින්නේ පහළ බසින තත්ත්වයයි. රාවන්ගේ රාජ්‍යයේදී දන් දෙන හා පූජා කටයුතු කරන අය ඒවා දෙන්නේ පාපකාරී ජීවයන්ටයි. ඔබගේ කලාවන් දිගින් දිගටම බැසගෙන යනවා. ඔවුන් යම් දෙයක් ලැබුවා වුවත් ඒ තාවකාලික කාලයක් සඳහා පමණයි. දැන් ඔබ ලබන්නේ උපත් 21ක් සඳහායි. එය හඳුන්වන්නේ රාමාගේ රාජ්‍යය ලෙසයි. එය දෙවියන්ගේ රාජ්‍යය කියා හැඳින්විය නොහැකියි. එය දේවතාවන්ගේ රාජ්‍යයයි. පියා කියනවා ඔබගේ ආදී සනාතන දෙවි දේවතා ධර්මය දැන් අතුරුදන් වී ගොස් තිබෙනවා. එය දැන් නැවතත් ස්ථාපිත වනවා. පියා තමයි ඔබට ප්‍රයෝජනයක් ගෙන එන තැනැත්තා වන්නේ. ඔහුව හඳුන්වන්නේ නියම බාබා ලෙසයි. ඔහු ඔබට ඔහුගේම නියම හැඳින්වීමත් මෙම නිර්මාණයෙහි මුල, මැද හා අග පිළිබඳවත් වූ දැනුමත් කියා දෙනවා. බාබා ඔබට මේ අසීමිත වූ ඉතිහාසය හා භූගෝලය ගැන කියා දෙනවා. මෙය ඉතා උසස් ආදායමක්. ඔබ මේ ලෝකයේ පාලකයන් බවට පත්වනවා. ඔවුන් බිහිසුණු ආකාරයේ චක්‍රයක් පෙන්වනවා. කෙසේවෙතත්, එය තමයි දැනුමේ චක්‍රය. කොහොමනමුත්, පසුව මෙම දැනුම අතුරුදන් වී යනවා. මෙය තමයි ඔබගේ ප්‍රධානතම පින්තූරය. එක් පැත්තකින් ත්‍රිමූර්ති පින්තූරය තිබෙන අතර අනෙක් පැත්තෙන් කල්ප වෘක්ෂයෙහි හා චක්‍රයෙහි පින්තූරය තිබෙනවා. ඔවුන් මෙම චක්‍රයෙහි කාල පරිච්ඡේදය වසර සිය දහස් ගණනක් තිබෙනවා කියා ලියා තිබෙන බව බාබා විස්තර කර දී තිබෙනවා. සෑම දෙයක්ම සම්පූර්ණයෙන්ම පටලැවිලා. එම පැටලිල්ල බාබාට හැර වෙන කිසිම කෙනෙකුට ලිහිය නොහැකියි. පියාම ඔබ ඉදිරියට පෞද්ගලිකවම පැමිණ සිටිනවා. ඔහු කියනවා නාටකයට අනුව මා පැමිණ සිටිනවා. මා මෙම බැම්මෙන් බැඳී තිබෙනවා. මා මෙහි එන්නේ නැතිව

සිටීම විය නොහැකි දෙයක්. මා මෙහි පැමිණ මියගිය අයෙකුට පණ දෙන්නේවත්, අසනීප වූ අයෙක්ව සනීප කරන්නේවත් නැහැ. බොහෝ දරුවන් කියනවා බාබා මට අනුකම්පා කරන්න. කොහොමනමුත්, මෙහිදී අනුකම්පා කිරීමක් ගැන ප්‍රශ්නයක් මතුවන්නේ නැහැ. ඔබ ඔබට ආශිර්වාද කිරීම සඳහා එන්න කියා මට කිව්වේ නැහැ. ඉතින් ඒ නිසා ඔබට කිසිම ලාභයක් වන්නේත් නැහැ. ඔබ කතා කරනවා අහෝ පාරිශුද්ධකරුවාණනි, එන්න! දුක ඉවත්කරන්නාණනි, සතුට පිරිනමන්නාණනි, එන්න! වෛද්‍යවරුන් පවා ශරීරයේ වේදනාව ඉවත් කරන්නන් වෙනවා. මේ සඳහාද මම එන්නේ? ඔබ කියනවා අපව ඒ නව ලෝකයේ පාලකයින් බවට පත්කර සාමය ලබා දෙන්න! මගේ අසනීපයෙන් මාව ගලවා ගන්න! කියා ඔබ කියන්නේ නැහැ. කෙනෙකුට සැමදාම සාමය හා විමුක්තිය ලද නොහැකියි. ඔවුන් ඔවුන්ගේ කොටස රඟපෑ යුතුමයි. අවසානයේදී එන අය විශාල සතුටක් ලබනවා. දැන් පවා ජීව දිගින් දිගටම පහළට බැසගෙන එනවා. ඔවුන් එතරම් කාලයක් නැවතී සිටියේ සාම දේශයේයි. නාටකයට අනුව තමන්ගේ කොටසේ මෙය තිබෙන අය එනවා. කිසිම කෙනෙකුගේ කොටසක් වෙනස්විය නොහැකියි. බාබා විස්තර කරනවා අවසානයේදී මෙහි ඒමට සිටින තවත් බොහෝ ජීව සාම දේශයේ වාසය කරනවා. මෙම නාටකය ඒ අයුරින්ම නැවත නැවතත් සිදුවනවා. මේ කල්ප වෘක්ෂයත් ඒ ආකාරයෙන්ම නිර්මාණය වී තිබෙනවා. මේ නිර්මාණය කර ඇති සියලුම පින්තූර ඔබ විස්තර කර දිය යුතුයි. මීට ඉහත කල්පයේදී නිර්මාණය වූවාක් මෙන් තවත් බොහෝ පින්තූර නිර්මාණය වීමට තිබෙනවා. කල්ප වෘක්ෂයේ පින්තූරයෙහි මේ උපත් 84හි පින්තූරයෙහි විස්තර තිබෙනවා. චක්‍රයෙහි පින්තූරයෙහි නාටකයත් තිබෙනවා. දැන් ඉනිමගෙහි පින්තූරය නිර්මාණය වෙමින් තිබෙනවා. මිනිසුන් කිසිම දෙයක් තේරුම් ගන්නේ නැහැ. ඔවුන් අන්තිම නිවටයන් (බුද්ධූ) බවට පත්වෙලා. ඒ උත්තරීතර පියා, උත්තරීතර ජීවය, දැනුම් සාගරය, සාමයේ සාගරය වන ඔහු මෙම ශරීරය මාර්ගයෙන් උගන්වන බව දැන් ඔය දරුවන්ගේ බුද්ධිය තුළ තිබෙනවා. පියා කියනවා මා ඇතුළුවන්නේ ලෝකයේ ප්‍රථමයෙන්ම පාලකයා බවට පත්වන තැනැත්තාගේ ශරීරයටයි. ඔබ බ්‍රහ්මා මාර්ගයෙන් සත්‍ය ලෙසම බ්‍රාහ්මීණ් දරුවන් බවට පත්වන බව දන්නවා. මේවා ගීතාවෙහි සඳහන් වී නැහැ. පරම පියා කියනවා මොහුත් තමාගේම පිළිරුව වන නාරායනට වන්දනා කළා. ඔහු දුම්රියෙන් යනවිට වුවත් ගීතාව අධ්‍යයනය කළා. මිනිසුන් සිතුවා ඔහු උසස්ම වූ ධාර්මික ජීවයක් කියලා. දැන් ඔහු ඒ සියලු දේ අමතක කරනවා. කෙසේවෙතත්, ඔහු ගීතාව අධ්‍යයනය කර තිබෙනවා. බාබා කියනවා මා සෑම දෙයක්ම දන්නවා. ඔබ කා ඉදිරියේද අසුන් ගෙන ඉන්නේ කියා සලකා බලන්න! ඔහු මාර්ගයෙන් තමයි ඔබ ලෝක පාලකයන් බවට පත් වන්නේ. එසේ නම් ඇයි ඔබ නැවත නැවතත් ඔහුව අමතක කරන්නේ? පියා කියනවා මා ඔබට දවසින් පැය 16ක් විවේක දෙනවා. කොහොමනමුත්, අනෙක් සියලු කාලය තුළ ඔබගේ සේවය කරන්න. ඔබ ඔබටම සේවයක් කර ගන්නවා යනු මුළු ලෝකයටම සේවය කිරීමක් වැනියි. නොයෙකුත් ක්‍රියාවල යෙදෙන අතරම අඩුම තරමින් පැය 8ක් වත් පියාව සිහිපත් කිරීමට උත්සාහ කරන්න. දැන්නම් දවස පුරාම ඔබට අඩුම තරමින් පැය 8ක් වත් පියාව සිහිපත් කළ නොහැකියි. ඔබ එම තත්ත්වය ලද විට ඔබ බොහෝ සෙයින් සේවය කරනවා යන්න තේරුම් ගත හැකියි. ඔබ විශාල සේවයක් කරනවා කියා සිතන්න එපා. සමහරු ඉතාමත් හොඳ පළමු පන්තියේ කතා පවත්වනවා. නමුත් ඔවුන් තුළ යෝගා ඇත්තේම නැහැ. ප්‍රධානම දෙය ස්මරණය නැමැති වන්දනා ගමනයි. පරමාත්ම පියා කියනවා ඔබගේ හිස මත විශාල පාප බරක් තිබෙනවා. එමනිසා, උදයෙන්ම නැගිට පියාව සිහිපත් කරන්න! පෙරවරු 2ත් පෙරවරු 5ත් අතර වාතාවරණය ඉතාමත් හොඳයි. රාත්‍රියේදී ජීවාත්මය ජීවාත්ම අවධානයට පත්වනවා. ඉතින් නින්ද කියා හඳුන්වන්නේ මෙයයි. මේ නිසා තමයි පරමාත්ම පියා කියන්නේ හැකි උපරිම අයුරින් පියාව සිහිපත් කරන්න. පියා දැන් කියනවා : මන්මනාභව්! මෙය තමයි ඉහළ නැඟීමේ මනෝ ස්ථිතිය සඳහා වූ මන්ත්‍රය වන්නේ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා සමඟ ඍජු වන්න, අවංක වන්න. ඔබ තමයි ඒ ත්‍යාගශීලී වූ පියාගේ දරුවන් වන්නේ. එමනිසා, ඔබ හැමෝටම ප්‍රයෝජනවත් වන අයෙක් විය යුතුයි. බලවත් වන්න!
2. නොයෙකුත් ක්‍රියාවල යෙදෙන අතර අඩුම තරමින් පැය 8ක ස්මරණයක්වත් තබා ගන්න. ස්මරණය තමයි ප්‍රධානම දෙය වන්නේ. පාප බර ගැලවී යන්නේ මෙයිනුයි.

**වරදානය:** ඔබ ත්‍යාගශීලී හදවතක් ඇති අයෙකු වී, සෑම සිතිවිල්ලකින්ම සෑම තත්පරයකම පරිත්‍යාග කිරීමෙන් මහා පරිත්‍යාගශීලියෙකු වේවා.

ඔබ දානපතියාගේ දරුවන් දේවල් ගන්න අය නොව දන් දෙන අයයි. ඔබ සෑම සිතිවිල්ලකින්ම සෑම තත්පරයකම දානය කළ යුතුය. එවැනි දානපතියෙකු වූ විට, ඔබ ත්‍යාගශීලී හදවතක් ඇති, මහා පරිත්‍යාගශීලියෙකු ලෙස හඳුන්වනු ලැබේ. එවැනි ශ්‍රේෂ්ඨ පරිත්‍යාගශීලියෙකු වීමෙන්, ඔබට ඉබේටම ශ්‍රේෂ්ඨතම බලය ලැබේ. කෙසේවෙතත්, දීමට නම්, ඔබේ නිධන් ගබඩාව පිරී තිබිය යුතුය. ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් ඔබ ගෙන ඇති අතර දැන් ඉතිරිව ඇත්තේ, දීම පමණි. එබැවින්, දිගටම දෙන්න, මන්ද දීමෙන්, ඔබේ නිධන් ගබඩාව ඊටත් වඩා පිරෙනු ඇත.

**පාඨය:** සෑම විෂයයකින්ම සම්පූර්ණ ලකුණු ලබා ගැනීම සඳහා, පරිණතභාවයේ ගුණය ධාරණය කර ගන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

නිරහංකාර ජීවාත්මයකට පහසුවෙන් සතුට දානය කරන්නෙකු විය හැකිය. කෙසේවෙතත්, අහංකාරය ඔබට නිහතමානීකමෙන් පිරී යාමට ඉඩ නොදේ. නිරහංකාර නොමැති නම්, සේවය සිදු විය නොහැක. සේවාධාරියකුගේ විශේෂත්වය නම් ඔහු නිරන්තරයෙන් නිහතමානීව හිස නැමීමයි. එවිට පමණක් ඔහුට අන් අයව නැමීමට සැලැස්විය හැකිය. ඔබ තුළ නිරහංකාර බව වැඩි වන තරමට, ඔබ වඩාත් නිහතමානී වනු ඇත. ඔබ නිහතමානී වූ විට, එහි "ලොකුකම" නොව, ආධ්‍යාත්මිකත්වය ඇති වේ. පරම පියා මෙහි බොහෝ නිරහංකාරව පැමිණෙන ආකාරයටම පියාව අනුගමනය කරන්න.